**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2013 පිළිසරු ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නිම් වැඩ වටිනාකම රු.5,092,719 ක් වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2016 වර්ෂයේදී රු.4,284,956 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකල නිම්වැඩ වටිනාකම රු.1,902,073 ක් වූ වාවින්න කඩකාමර සංකීර්ණය 2016 වර්ෂයේදී රු.1,892,073 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) 2017 වර්ෂයේ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.4,046,740 ක වියදමක් දරා ඉදිකර තිබුණු කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිලි රු.4,236,834 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (iv) 2013 දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිකර සංවර්ධනය කරන ලද නිමි වැඩ වටිනාකම රු.8,074,024 ක් වූ පරගහකැලය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සභාව සතු වත්කම් ප්‍රාග්ධනිත කළයුු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) සමාලෝචිත වර්ෂයේ ඉටුකරන ලද සංවර්ධන ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.7,269,657 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, එම කර්මාන්ත ඉටුකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.7,269,657 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) සභාව සතු රු.450,000 ක වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) 2018 වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.1,419,166 ක් රු.1,258,083 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) සමාලෝචිත වර්ෂයට අදාල රු.57,120 ක විවිධ වියදම ගිණුම් වල උපචිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ix) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳූ ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම් විෂයන් 04 ක හා පොදු තැන්පත් ගිණුමෙහි ශේෂයන්හි එයට අදාල උපයෝගී පොත්පත් හා ලේඛනයේ තොරතුරු සමඟ සැසඳීමේදී රු.76,956,614 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 හා ඊට පෙර වර්ෂ වල සිට ගිණුම්වල පැවත එන රු.37,513 ක් වූ කුලී හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.13,969,260 ක වත්කම් විෂයයන් 06 කට හා රු.5,567,873 ක වගකීම් විෂයයන් 03 කට අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**-----------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------**

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 19 (i) හා (ii) වගන්ති | පළාත් පාලන කොමසාරිස්ගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව තාවකාලික බර වාහන යන්ත්‍ර ක්‍රියාකරුවෙකු බඳවාගෙන 2018 ජූලි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල රු.187,250 ක වැටුප් ගෙවා තිබුණි. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | අනුමැතිය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය හා පරිපාලන) 207 | සභාව සතුව හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන තක්සේරු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ඉඩම් තක්සේරු කර පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------- | | | |
| i. මුදල් රෙගුලාසි 110 | සභාව සතු වාහනයකට හා යන්ත්‍රෝපකරණයකට සිදුවූ අනතුරු හා අලාභ සම්බන්ධයෙන් හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරමි. |
| ii. මුදල් රෙගුලාසි 571(3) | 2014, 2015 හා 2016 වර්ෂ වලදී තැන්පත් කරන ලද රු.150,236 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු | පිළිගතිමි. ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි. |

වේ.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
----------------

| | | | |
|---|---|---|---|
| i. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | ධාවන තත්වයේ පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 08 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි. |
| ii. 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | ධාවන තත්ත්වයේ පවතින වාහන 03 ක් අපහරණය කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී පලාත් සභාව හරහා අපහරණය කිරීමට කටයුතු කරමි. |
| (ඉ) 2015 ඔක්තොම්බර් 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඇඟිලි සලකුණු යන්ත්‍රයට අකුණුසැර වැදීම හේතුවෙන් අක්‍රියවී ඇත. එය අළුත්වැඩියා කර හෝ නව යන්ත්‍රයක් ඉදිරියේදී භාවිතා කිරීමට කටයුතු කරමි. |
| (ඊ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාව සතු කඩකාමර 08 ක් තක්සේරු නොකර 2018 වර්ෂයේදී ද බදු දී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී තක්සේරු කර විධිමත්ව බදු දීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.612,895 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,300,493 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 බිල්කළ ආදායම් | 2018 රැස්කළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් හා බදු | 270,000 | 66,000 | 66,000 | -- | 315,000 | 75,550 | 75,550 | -- |
| කුලී | 2,438,600 | 2,336,012 | 2,353,833 | 23,039 | 2,358,600 | 1,843,205 | 1,829,063 | 50,690 |
| බලපත්‍ර ගාස්තු | 372,000 | 712,590 | 712,590 | 22,505 | 256,000 | 287,670 | 293,470 | 22,505 |
| වෙනත් ආදායම් | 2,013,006 | 2,644,399 | 2,552,486 | 413,967 | 2,101,000 | 1,299,987 | 880,430 | 977,408 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | මේ වන විට කටයුතු කරමින් පවතී. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර ඒ අනුව වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. එමනිසා වාර්ෂික කාර්ය සාධනය ඇගයීමේ හැකියාව අහිමි වී ගොස් තිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු වේ. | පිළිගනිමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස වීදුරුවට සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පැවතිය යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. රියදුරුට අවවාද කර පෞද්ගලික ලිපිගොනුවට ලිපියක් ලබා දී ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තය<br>2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක පුරප්පාඩු 06 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතු වේ. | පිළිගතිමි. |
| (ආ) සභාවේ සේවය කර විශ්‍රාම ගොස් තිබුණු හා ස්ථාන මාරු වී ගොස් තිබුණු නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය නොවී පවතින රු.39,388 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයනොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.450,000 ක් වටිනා ට්‍රේලර 02 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | වත්කම් ලේඛනගත කල යුතු වේ. | පිළිගතිමි. ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

### 3.4.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිකර 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභාව වෙත බාර දී තිබුණු රු.8,074,024 ක් වටිනා සංස්කෘතික මධ්‍යස්ථානය ප්‍රමාණවත් ආදායම් උපයා ගැනීමේ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණි. | ආදායම් උත්පාදනය කරන කාර්යයන් සඳහා යොදාගත යුතු වේ. | පිළිගතිමි. දැනට ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කරමින් පවතී |

### 3.4.3 පවරා නොගත් වත්කම්

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් කැබලි 44 ක් පවරා ගෙන නොතිබුණි. | දේපල වල නීත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී පවරා ගැනීම සඳහා කටයුතු කරමි. |

### 3.4.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව සතු භාවිතයට ගත හැකි තත්ත්වයේ පැවති රු.1,700,000 ක් වටිනා වාහන 02 ක් 2018 වර්ෂය අවසානය වන විටත් කිසිඳු කාර්යයකට භාවිතා නොකර සභා භූමියේ ගාල්කර තිබුණි. | වාහන භාවිතයට ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. අළුත්වැඩියා කිරීමට අවශ්‍ය බැවින් ඉදිරියේදී එසේ කර භාවිතා කිරීමට කටයුතු කරමි. |

### 3.4.5 වාහන උපයෝජනය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව සතු රු.59,758,361 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ 09 ක් රක්ෂණය කිරීමෙන් තොරව හා වාහන 12 ක් වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා නොගෙන 2018 වර්ෂයේදී ධාවනයේ යොදවා තිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හා රක්ෂණය කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. මේ වනවිට රක්ෂණය කර වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර ඇත. |

### 3.5 ප්‍රසම්පාදනය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව 2018 වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වේ. | පිළිගනිමි. මේ වනවිට එසේ කරමින් පවතී. |